# ශ්‍රී ලංකා දේශීය සම්බන්ධිකරණ කමිටු යාන්ත්‍රණය ස්ථානගත කිරීම සහ සිතියම්ගත කිරීමට (අනුරූපනයට) සහාය ලබාදීම සඳහා ජාතික උපදේශකවරයෙකු වෙනුවෙන් කැමැත්ත ප්‍රකාශ කිරීම

ශ්‍රී ලංකා දේශීය සම්බන්ධිකරණ කමිටු යාන්ත්‍රණය ස්ථානගත කිරීම සහ සිතියම්ගත කිරීමට (අනුරූපනයට) සහාය ලබාදීම පිණිස උපදේශකවරයෙකු පත් කර ගැනීමට නියමිත බැවින් ඊට උනන්දුවක් දක්වන ශ්‍රී ලාංකිකයන්ට සිය උනන්දුව ප්‍රකාශ කරන ලෙස ශ්‍රී ලංකා දේශීය සම්බන්ධිකරණ කමිටුවේ සභාපති ඉල්ලා සිටී. ක්ෂය රෝගය, එච්. අයි. වී. / ඒඩ්ස් පාලනයටත්, රටෙහි සෞඛ්‍ය පද්ධතිය ශක්තිමත් කිරීම සඳහාත් ශ්‍රී ලංකා දේශීය සම්බන්ධිකරණ කමිටුවට ගෝලීය අරමුදල වෙතින් ප්‍රදානයන් ලැබේ.

රටක බහු-හවුල්කාරිත්ව සහ බහු-ආංශික සංවර්ධන සැලසුම් සඳහා වගකිව යුතු ඉහළ මට්ටමක දේශීය සම්බන්ධිකරණ කමිටුව ස්ථානගත කළ යුතු බව එහි ප්‍රතිපත්තියෙහි දක්වා ඇත. ගෝලීය අරමුදල විසින් ජාතික ව්‍යුහයන් මත ගොඩනැගීමට සහ පවත්නා සෞඛ්‍ය වේදිකා තුළ දේශීය සම්බන්ධිකරණ කමිටුව සහ/හෝ දේශීය සම්බන්ධිකරණ කමිටු කාර්යයන් ස්ථානගත කිරීමට දිරිමත් කරනු ලබයි. ගෝලීය අරමුදල් මූල්‍යකරණයෙන් ඉවත් වීමට ශ්‍රී ලංකාව ද සූදානම් විය යුතු බැවින්, ස්ථානගත කිරීමේ සැලැස්මක් සහ ක්‍රියාත්මක කිරීම අවශ්‍යතාවයක් බව පෙන්වා දෙයි. දේශීය සම්බන්ධිකරණ කමිටුවේ කාර්යයන් ආයතනගත කිරීමේ පළමු පියවර වන්නේ පවතින සෞඛ්‍ය පාලන ආයතන සිතියම්ගත කිරීම යි. ඵලදායී සංක්‍රාන්ති ක්‍රියාවලියකට සහායවීමට මෙන්ම වැඩි තිරසාරභාවයක් ප්‍රවර්ධනය කිරීම පිණිස දේශීය සම්බන්ධිකරණ කමිටුවවෙහි කාර්යභාරය අනුවර්තනය සඳහා මෙම කරුණු දෙක භාවිතා කළ යුතු වේ.

## උපදේශන සේවාවේ අරමුණු

උපදේශකයා විසින් දේශීය සම්බන්ධිකරණ කමිටුවට අදාලව ජාතික පද්ධති තුල හඳුනාගත් එක් එක් වේදිකාවේ පිහිටීම සිතියම් ගත කරනු ඇත. උපදේශකයා විසින් දේශීය සම්බන්ධිකරණ කමිටුව ස්ථානගත කිරීමේ සැලැස්මක් ද සකස් කරනු ඇත.

## ඉටු කළ යුතු කාර්යයන්

පහත සඳහන් කටයුතු කිරීම ජාතික උපදේශකවරයාගෙන් අපේක්ෂා කෙරේ:

1. ස්ථානගත කිරීමේ මූලධර්මය අවබෝධ කරගෙන ඊට හුරුපුරුදු වීම.
2. සංක්‍රාන්ති කාචය සහ එය ස්ථානගත කරන ආකාරයට අනුව එය ගැලපෙන ආකාරය තේරුම් ගැනීම.
3. අදාල ලියකියවිලි කියවා බලා සමාලෝචනයක් සිදුකිරීම.
4. ජාතික මට්ටමේ ප්‍රධාන පාර්ශවකරුවන් සමග සම්මුඛ සාකච්ඡා පැවැත්වීම.
5. පවත්නා ජාතික සෞඛ්‍ය ව්‍යුහයන් සිතියම්ගත කිරීම.
6. සාරාංශ වාර්තාවක් සකස් කිරීම.
7. රටතුල උපදේශන රැස්වීමක් සංවිධානය කිරීම.
8. දේශීය සම්බන්ධිකරණ කමිටුව ස්ථානගත කිරීමේ සැලැස්මක් සකස් කිරීම.

## බාරදිය යුතු දේ:

1. පවත්නා ජාතික සෞඛ්‍ය වේදිකා සිතියම්ගත කිරීම
2. ලුහුඬු සාරාංශ වාර්තාව
3. Power Point ඉදිරිපත් කිරීම
4. ස්ථානගත කිරීමේ සැලැස්ම

## වාර්තා කිරීමේ අනුපිළිවෙල

1. දේශීය සම්බන්ධීකරණ කමිටුවේ විධායක කමිටුවට සහ දේශීය සම්බන්ධීකරණ කමිටුවේ අධීක්ෂණ කමිටු සභාපති වෙතට උපදේශකවරයා විසින් වාර්තා කරනු ඇත.
2. උපදේශකවරයා දේශීය සම්බන්ධීකරණ කමිටුව සහ දේශීය සම්බන්ධීකරණ කමිටුවේ අධීක්ෂණ කමිටුව සමග සහයෝගයෙන් කටයුතු කරනු ඇත.
3. උපදේශකවරයා විසින් බාරදෙනු ලබන දේ ගෝලීය අරමුදල සමග බෙදාගන්නා ලෙස දේශීය සම්බන්ධීකරණ කමිටු ලේකම් කාර්යාලයයෙන් ඉල්ලා සිටිනු ලැබේ.

## කාර්යසාධන කාලය

උපදේශකවරයා විසින් මාස දෙකක (02) කාලයක් ඇතුලත උපදේශන කටයුතු නිම කළ යුතු වේ.

## සුදුසුකම්

මහජන සෞඛ්‍ය, මූල්‍ය, රාජ්‍ය පරිපාලනය හෝ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උසස් උපාධිය

## පළපුරුද්ද

- දේශපාලන පරිසරයන් තුල හවුල්කාරිත්වයන් වර්ධනය කිරීම සහ දේශීය, කලාපීය සහ ජාත්‍යන්තර මට්ටම් වල දී සංකීර් ණ ගැටළු සහ බාරදීම් සඳහා මැදිහත්වීම පිළිබඳ ශක්තිමත් අත්දැකීම් තිබීම
- ක්‍රමෝපාය මාර්ග සහ ප්‍රතිපත්ති විශ්ලේෂණය, වැඩසටහන් සැලසුම් කිරීම සහ කළමනාකරණය, සහ/හෝ සමාන පළපුරුද්දක් ඇතුළු ඉහළ වෘත්තීය පළපුරුද්ද
- ක්‍රමෝපායික, ආයතනික, මූල්‍ය සහ කළමනාකරණ ගැටළු පිළිබඳ තහවුරු වූ අවබෝධයක් සහ අත්දැකීම් තිබීම
- ගෝලීය අරමුදලේ ක්‍රියාවලීන් සහ එහි අරමුදල් ආකෘතිය පිළිබඳ හොඳින් තහවුරු වූ අවබෝධයක් තිබීම
- මානුෂීය අංශයේ සැලසුම් සහ කළමනාකරණය සම්බන්ධයෙන් අවම වශයෙන් වසර 3 ක (ජාත්‍යන්තර හෝ ජාතික) වෘත්තීය පළපුරුද්ද.
- එච්. අයි.වී. සහ ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාව කෙරෙහි අවධානය යොමු කරමින් මහජන සෞඛ්‍ය සහ රෝග වැඩසටහන් කළමනාකරණය පිළිබඳ පළපුරුද්ද
- බහු- පාර්ශ්වකරුවන් අතර සම්බන්ධීකරණය පිළිබඳ ලේඛනගත වී ඇති පළපුරුද්ද
- සමාන උපදේශන සේවා සම්බන්ධ ලේඛනගත වී ඇති පළපුරුද්ද

## නිපුණතාවයන්

- සිංහල සහ/හෝ දෙමළ භාෂාව පිළිබඳ ව්‍යක්තභාවය සහිතව ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඉහළම ප්‍රවීණතාවය
- විශිෂ්ට ලිඛිත හා වාචික සන්නිවේදන කුසලතා.
- Visio, Word, Excel, Access, Email, Internet සහ Websites යන මෘදුකාංග පිළිබඳ ඉතා හොඳ දැනුම අත්‍යවශ්‍ය වේ
- පාලන කටයුතු පිළිබඳ ඉතා හොඳ අවබෝධයක්
- සංවිධානය, ඉදිරිපත්වීම සහ දේශපාලන දැනුවත්භාවය ඉහළ මට්ටමක තිබීම.

- මහජන සෞඛ්‍ය ගැටළු පිළිබඳ දැනුම
- ශක්තිමත් අන්තර් පුද්ගල කුසලතා සහ රාජ්‍ය, රාජ්‍ය නොවන සංවිධාන, එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන සහ පෞද්ගලික අංශයේ ඉහළ මට්ටමේ නිලධාරීන් සමඟ සන්නිවේදනයේ යෙදීමට සහ අන්තර් ක්‍රියාවල යෙදීමට ඇති හැකියාව.
- වාර්තා ලිවීමේ සහ ඉදිරිපත් කිරීමේ ඉහළ කුසලතා
- සංවර්ධන කටයුතු පිළිබඳ පෙර අත්දැකීම් සහ/හෝ රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ සේවා පසුබිමක් තිබීම යෝග්‍ය වේ
- විවිධ කාර්යයන් එකවර හසුරුවන අතරතුර කණ්ඩායමක් මෙහෙයවීමට සහ ප්‍රමුඛතා සැකසීමට ඇති හැකියාව

**වයස සීමාව සහ උපදේශකත්වයේ වටිනාකම**
- වයස සීමාව - විවෘතයි
- උපදේශකත්වයේ වටිනාකම - සාකච්ඡා කළ හැක. මනාපය දැක්වීමේ ලියකියවිලි සමග මූල්‍ය යෝජනාවද ඉදිරිපත් කළ යුතු වේ.

**පොදු කොන්දේසි:**
- රාජ්‍ය අංශයේ හෝ රාජ්‍ය ආයතනවල සේවයේ යෙදෙන නිලධාරීන් අදාල ආයතන ප්‍රධානීන් හරහා සිය කැමැත්ත ප්‍රකාශ කිරීම් ඉදිරිපත් කළ යුතු ය.
- මෙම තනතුර නිවස පදනම් කරගත් එකක් ලෙස සලකනු ලැබේ.
- කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලැබේ.
- තෝරා ගැනීමෙන් සති 2 – 4 කාලය ඇතුලත උපදේශක තනතුර භාර ගැනීමට අදාල තෝරගත් අයදුම්කරුට හැකි විය යුතු ය.

අයදුම්කරුවන් ඔවුන්ගේ අදාළ පළපුරුද්ද සහ අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ කෙටි සාරාංශයක්, උපදේශනය සඳහා සුදුසු වීමට හේතු සහිත මූල්‍ය යෝජනාවක් ද සමඟ කැමැත්ත ප්‍රකාශ කිරීම් ඉදිරිපත් කළ යුතුය.

කැමැත්ත ප්‍රකාශ කිරීම් **දේශීය සම්බන්ධීකරණ කමිටු ලේකම් කාර්යාලයය, මහජන සෞඛ්‍ය පරිශ්‍රය, 555/5 ඇල්විටිගල මාවත, කොළඹ 5** යන ලිපිනයට, කවරයේ වම් පස උඩ කෙළවර **ශ්‍රී ලංකා දේශීය සම්බන්ධීකරණ කමිටු යාන්ත්‍රණය ස්ථානගත කිරීම සහ සිතියම්ගත කිරීමට සහාය වීමේ ජාතික උපදේශක** යනුවෙන් සදහන් කර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. **2023 ජූලි මස 8වන** දින හෝ ඊට පෙර කැමැත්ත ප්‍රකාශ කිරීම් ලැබිය යුතු වේ.

**එස්. ජනක ශ්‍රී චන්ද්‍රගුප්ත,**
**සභාපති/ දේශීය සම්බන්ධීකරණ කමිටුව, ලේකම්/ සෞඛ්‍ය අමාත්‍යාංශය,**
**385, පූජ්‍ය බද්දේගම විමලවංශ මාවත,**
**කොළඹ 10**